# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2013 මාර්තු මස 19 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.02.19 දින අසන ලද ප්‍රශ්නය:**

(ප්‍ර/V (01)13/03)

අ. බත්තරමුල්ල බටපොත ශ්‍රී සුදර්ශන විද්‍යාලය සපිරි පාසැල් ව්‍යාපෘතියට ඇතුළත් වී තිබේද?

ආ. ඒ අනුව එහි ද්වීතියික අංශය ඉවත් කිරීම අරඹන්නේ කවර වර්ෂයක සිටද ?

ඇ. එම පාසල සපිරි පාසල් ව්‍යාපෘතියට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපයේ පළාත් සභා මන්ත්‍රී කමිටුවේ අනුමැතිය ලබා දී තිබේද?

ඈ. එම පාසලින් ද්වීතියික පංති ඉවත් කිරීම වැළැක්වීම වෙනුවෙන් 2013.02.03 දින විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් උපහාර උත්සවයක් පැවැත්වීද?

ඉ. ඒ සඳහා එම විදුහලේ විදුහල්පතිවරයා සම්බන්ධවීද ?

ඊ. එහිදී උපහාර ලැබූ අය කවුද ?

**02. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.02.19 දින අසන ලද ප්‍රශ්නය:**
**(ප්‍ර/V (1)13/04)**

2005 සිට 2012 දක්වා කළුතර අධ්‍යාපන කලාපයේ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී,

ආ. එක් එක් විෂය සඳහා පෙනි සිටි සිසුන් ගණන,

ඇ. එක් එක් විෂය සමත් වූ ප්‍රමාණය ,

ඈ. එක් එක් විෂය සඳහා සමත්වීමේ ප්‍රතිශතය,

මෙම පළාත් සභාවට ඉදිරිපත් කරන්නේද?

**03. ගරු මංජු ශ්‍රී අරංගල විපක්ෂනායකතුමා විසින් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:**
**(ප්‍ර/V(1)13/05)**

අ. 2010 වර්ෂය සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව නූල් මිලදී ගත් ආයතනය නම් කරන්නේද ?

ආ. එම නූල් වර්ණ ගැන්වීම කරන ලද ආයතනය නම් කරන්නේද ?

ඇ. නූල් මිලදී ගත් ආයතනයෙන්ම වර්ණ ගැන්වීම කළ බව පිළිගන්නේද ?

ඈ. මිලදී ගත් නූල් මහර ගබඩාව වෙත එම ප්‍රමාණයෙන්ම ලැබී නැති බව පිළිගන්නේද ?

ඉ. එසේ මිලදී ගත් නූල් වලින් මහර ගබඩාව වෙත නොලැබුණ නූල් ප්‍රමාණය කොතෙක්ද?

ඊ. මෙහිදී සිදුවී ඇති බරපතල අක්‍රමිකතාවය පිළිබඳ අල්ලස් හා දූෂණ කොමිසම මගින් පරීක්ෂණයක් පවත්වන බව පිළිගන්නේද?

උ. එසේ නම් එහි ප්‍රගතිය පැහැදිලි කරන්නේද?

ඌ. මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ නිලධාරීන් පිළිබඳ දෙපාර්තමේන්තු මට්ටමින් විනය පරීක්ෂණයක් පවත්වන්නේද?

එ. නොඑසේනම් ඒ මන්ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා :

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල මෑත කාලයේ අර්බුද රැසක් පැන නැගිණ. රටේ ඉහළම බුද්ධිමය සම්පත වන විශ්ව විද්‍යාල ආචාර්ය, මහාචාර්යවරු අඛණ්ඩ වර්ජනයක නිරතව සිටියහ. මෙම අර්බුදයන් රැසකටම මූලික හේතුව අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීමයි. යුනෙස්කෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලදුව, ශ්‍රී ලංකාවේ ආණ්ඩු විසින්ද වරින් වර පිළිගනු ලැබූ යෝජනාවක් වන දළ දේශීය නිශ්පාදිතයෙන් 6% අධ්‍යාපනයට වෙන් කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි.

(යෝ/v(01)12/16)

02. ගරු සුගත් මතුගමගේ මන්ත්‍රීතුමා :

"ජාත්‍යන්තර බෙදුම්වාදී කුලී හේවා බල ඇණිය ලෙස කටයුතු කළ එල්.ටී.ටී.ඊ. ම්ලේච්ඡ ජාතිවාදී සන්නද්ධ කල්ලිය යුධමය වශයෙන් තීරණාත්මකව පරාජය කිරීමෙන් පසුව විවිධ දේශීය හා විදේශීය බෙදුම්වාදී කුමන්ත්‍රණකරුවන් තම පැරණි න්‍යාය පත්‍රය නැවත ස්ථාපනය කර නව උපාය මාර්ගික ප්‍රවේශයකින් අළුත් තත්වයක් යටතේ දියත් කර ඇති බැවින් ශ්‍රී ලංකාවට එරෙහිව දියත්වන ඒ නව ඊළාම් සැලසුම පරාජයට පත් කිරීමට සමස්ථ ජාතියම පෙළ ගැස්විය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි".

(යෝ/v(01)12/17)

## X. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.03.05 දින
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
5 වන මහළ, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda – 2013.03.06 docx